**සංස්කරණය/Editor**
අසෝක සුබසිංහ Asoka Subasinghe

**උපදේශක සංස්කාරක**
ජගත් ජේ එදිරිසිංහ Jagath J Edirisinghe

**සංස්කරණ සහය/Asst. Editors**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක**
අසෝක සිල්වා Asoka Silva

**සන්නස පිරිවර**

සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

**සේයා රූ**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**පිටු සැකසුම සහ ග්‍රැෆික් නිර්මාණ**
**Page Layout & Graphic Designs**
සාමන්ත තැන්නගේ Saamantha Tennege

**සමබන්ධීකරණය**

| | |
|---|---|
| **NSW** | **WA** |
| Lakshman Kodituwakku | Kapila Hemantha |
| 02 9626 7660 | Balage |
| 02 9837 5055 | 08 9456 1972 |
| **QLD** | **ACT** |
| Ananda Samaratunga | Asoka Nimalasiri |
| 07 3372 7953 | 0400 429 031 |
| **SA** | **TAS** |
| Chandra Eeriyagama | Anura Seneviratne |
| 08 8331 2318 | 03 6327 4259 |

Sannasa
61 Nettle Drive
Hallam Vic 3803 Australia
Web: www.sannasa.net
email : sannasanews@gmail.com
Tel/Fax : 03 9796 4241


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත.

CIRCULATION - 10000 COPIES IN AUSTRALIA

### සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය ඉතා කෙටියෙන් ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.

## මාධ්‍ය මර්ධනයේ අදිසි හස්තය සහ තිස්සෙයිනායගම්

සිටි අවුට්රිච් වෙබ් අඩවියේ කර්තෘ සහ සන්ඩේ ටයිම්ස් පුවත්පතේ තීරු ලිපි රචකයකු වූ ජයප්‍රකාශ් තිස්සෙයිනායගම් මාධ්‍යවේදියා සත්‍යය ලිවීමේ වරදට විසි වසරකට බරපතල වැඩ ඇතිව සිරගත කිරීම අද දවසේ සමස්ත ශ්‍රී ලාංකේය මාධ්‍ය සසළ කරන සිදුවීම බවට පත්ව ඇත.

බරපතල වැඩ සහිතව වසර විස්සක සිර දඬුවමක් යනු ලංකාවේ ජනමාධ්‍යවේදියකු එදා මෙදා තුර ලැබූ ඉහළම සිර දඬුවමයි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ දඬුවම් ලද පළමු මාධ්‍යවේදියා වන ඔහුට දුන් දඬුවමට පදනම් වී ඇත්තේ 2006 දී ඔහු විසින් ලියන ලද ලිපි දෙකකි. අදාල ලිපි දෙකෙහි ජනවාර්ගික නොසන්සුන්තාව වර්ධනය කරනා කරුණු අඩංගු වේ යයි අධිකරණය තීරණය කර ඇත. මෙය ශ්‍රී ලංකා වාසීන්ගේ සිතීමේ හා අදහස් ප්‍රකාශ කිරීමේ මානව හිමිකම අමු අමුවේ මරා දමන තීන්දුවකි.

*තිස්සෙයිනායගම් කිසිදු ආකාරයක ප්‍රචණ්ඩ ක්‍රියාවකට සම්බන්ධවූවකු නොවන බව ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය වලට සම්බන්ධ සැවොම දනිති. ඔහු සැම විටම පෙනී සිටියේ සහජීවනය හා අන්තර්වාර්ගික යුක්තිය උදෙසා ය.* 2008 මාර්තු මාසයේදී ඔහු අත්අඩංගුවට ගත් දා සිටම විවිධ අංශ වලින් ඒ අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් විරෝධතා මතුවූයේ එනිසා ය.

තිස්සෙයිනායගම් සිය වර්ගයා වෙනුවෙන් පමණක් පෙනී සිටි මාධ්‍යවේදියකු නොවේ. 88-89 භීෂණයේදී ඔහුගේ පැන පණ ගැන්වුණේ බල්ලන් බළලුන් මෙන් තැන තැන මරා දමුණු සිංහල තරුණයන් වෙනුවෙනි. මානව හිමිකම් රැකීමේ පතාක යෝධයකු වූ අද ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා මේ මර්ධනය



සම්බන්ධයෙන් එවකට තිබුණ යූඑන්පී මිනීමරු රජයට එරෙහිව හොර රහසේ ජිනීවා රැගෙන ගිය ලියවිලි සකස් කෙරුණේ තිස්සෙයිනායගම් අතිනි. ඒ බව මහින්ද සමගින් එකට වැඩ කළ වාසුදේව නානායක්කාර මහතා පසු-ගියදා හෙළිදරව් කර තිබුණි. එවන් වූ සටන් සගයකු සත්‍යය ලිවීමේ වරදට සිය පාලනය යටතේ සිරගෙට දක්කීම මහින්ද වැන්නකුට තරම් නොවේ යයි අපි සිතමු.

"වාරණයේ ආන්තික ස්වරූපය ඝාතනය යි" ජෝජ් බර්නාඩ් ෂෝ වරක් කීවේ ය. ඝාතනයෙන් වාරණය කර අත් වල ලේ ගාවා ගන්නවාට වඩා නීතියේ වෙස් මුහුණ යට සැඟවී වාරණය කිරීමේ ක්‍රමවේදයන් අද අත්හදා බැලෙමින් තිබෙන බව තිස්සෙයිනායගම් සිදුවීම් දාමය පෙන්වා දෙයි.

තිස්සෙයිනායගම්ට දඬුවම් දීම මගින් රජය මේ අනතුරු අඟවන්නේ සියළු නිදහස් මතධාරී මාධ්‍යවේදීන්ට ය. එහි සැඟවුණ අර්ථය රජයේ ක්‍රියාවන්ට විරුද්ධව එසවෙන සියළු පෑන් බිම තබාපල්ලා යන්න ය. එය තේරුම් ගැනීමට මේ නීතිය යටතේම සිංහල මාධ්‍යවේදියකු සිරගෙට දක්කන දිනය එන තෙක් බලා සිටිය යුතු නොවේ. යුක්තියේ සහ සාධාරණයේ නාමයෙන් ජේ එස් තිස්සෙයිනායගම් නම් වන මාධ්‍යවේදියා නිදහස් කරගැනීමට පෙළ ගැසිය යුතු යයි අප කියන්නේ එනිසා ය.

# පාතාලය ජය ගැනීමට

***අද බත් පැකට් එකකට ඡන්දය දෙන දායකයන් විරලය. අද ඒ වෙනුවෙන් එක ඡන්දයකට රුපියල් භාරපන්සීයක්වත් වැය කළ යුතු වේ. රාජපක්ෂ ජනාධිපතිවරයා කොළඹ දිස්ත්‍රික්යේ එක්තරා ආසනයට පත්කර ඇත්තේ එවැනි අයෙකි. ඔහුට අතමිට දිගහැර වියදම් කිරීමට මුදල් ඇත. මස්පිඩු නලියන ඇඟලතක් ඇත. සංගීත සංදර්ශන වලට නළු නිළියන් ගායක ගායිකායවන් ගෙන්වා ඡන්දදායකයන් නැටවිය හැකි ය. අතමිට මොළවා පහරදිය හැකි ය. ඔහු ළාබාල දැරියක්ද දූෂණය කර ඇති බව ජනතාව කියයි. විදේශගත අධ්‍යාපනයක් ලැබුවද ඔහුගේ දේශපාලන දැනුම බිංදුවකි.***

**ලක්ෂමන් කොඩිතුවක්කු**

යුද්ධයෙන් ජයගත් මහින්ද ජනාධිපතිවරයාගේ මීළඟ වික්‍රමය වන්නේ ආර්ථිකය ජය ගැනීමට වඩා පාතාලය ජය ගැනීමය. යුද්ධයෙන් ජයගත් මහින්දට පාතාලය ජය ගැනීම මොන තර්ජනයක්ද කියා අපි සිතුවත් එය හිතන තරම් පහසු සෙල්ලමක් නොවන්නේ පාතාලය බේරාග උනීමට ඉහළ පෙළේ දේශපාලඥයන් හා පොලිස් ලොක්කෝ දරණ උත්සහ සහ බලපෑම කොතෙක්ද යන්න මේ වනවිට රටට දැනී ඇති නිසාය. පාතාලය ගැන කථාකරන විට එය නොයෙක් ප්‍රභේදයන්ට වර්ග කිරීමට සිදුවේ. එසේ වර්ග කිරීමට පෙර සිතනවා නම් පාතාලය යනු ගමේ ගොඩේ නගරේ කඩ සාප්පුවලින් එදවේල සොයා ගැනීමට චණ්ඩි පාට් දමා චොප්ප අයියලාගේ සිට දේශපාලන බල පුළුවන්කාරකම් තුළින් ඉහළට ආ මත්ද්‍රව්‍ය වෙළඳමේ නිරත වෙමින් ඉහළ පෙලේ වැජඹෙන මහා පරිමාණයේ අති සුඛෝපභෝගී පාතාලයයි. රැකියාවක් නැතිකම, දුප්පත්කම ආදියෙන් මතුව ආ පාතාලය සුද්ධ පවිත්‍ර කිරීමට ආණ්ඩුවට පහසුය අනෙක් උන් පිළිබඳව අහන්නට බලන්නට කොනෙකුද නැත. ඒ පාතාලය අද නැත්තටම නැතිකර ඇත. අන්තිමේදී ඒවායින් රිංගා ගිය පාතාලයේ පොඩි එකා අද නතර වී ඇත්තේ මහා පරිමාණයේ පාතාලයේ ලොකු එකා ළඟය. අතට ටී 56 ක් පිස්තෝලයක් සමගින් යහමින් මුදල්ද ලැබෙන මෙම පොඩි එකා "මුදල් යනු සියලු සැප සම්පත් ලබාදෙන ඉසිවරයෙකු යයි" සිතමින් මුදලට ඕනෑම බලු වැඩක් කරති. අපේ දේශපාලඥයන් සිතන්නේද උන් ලෙසම මේ දෙගොල්ලෝ එකතු වී පාතාලය සංවර්ධනය කරති.

ඊළඟට පාතාලයේ අනෙක් ප්‍රභේදය වන්නේ හමුදාවෙන් පොලිසියෙන් පැන ඉක්මනට පොහොසත් වීමට දඟලන හමුදා පුහුණුවක් ලැබූ හමුදා භටයින් හා පොලිසියයි. ඉලක්කයට වෙඩි තබමින් තත්පර දෙක තුනකින් මිනිසකු මරා දැමිය හැකි ඔවුන්ගෙන් සමහර පිරිස් පාතාලය සමඟ සම්බන්ධවන්නේ දේශපාලකයන් ගේ ආරක්ෂක භට පිරිසට සම්බන්ධවෙමිනි. අද රට පුරාම විසිරී සිටින මෙම පාතාලය මහා පරිමාණයේ බැංකු මංකොල්ල සේම ගමේ ගොඩේ කඩ කඩා කළු සල්ලි උපයති. ඊළඟ ප්‍රභේදය වන්නේ පොලිසියේ ඇතුලේ ම සිටින පාතාලයයි. පාතාලයටත් වඩා භයානක මොවුන් සොයා ගැනීමට රජය වෙහෙසක් දරන්නේ රට බේරාගැනීමට නිර්මල සංස්කෘතියක් බිහි කිරීමට වඩා ඔවුන්ගේ ජීවිත බේරාගැනීමටය. කොටින් හා මත් වෙළඳාම සමඟ සම්බන්ධවෙමින් මුදල්

10 වන පිටුවට

